# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
### (බාහිර) - 2007

### පුස්තකාල හා විඥාපන විද්‍යාව - LISC - E1025

### පුස්තකාල, ඒවායේ සේවා, එකතු සංවර්ධනය හා කළමනාකරණය

**පුශ්න හතරකට (04) පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි　　　　　　කාලය : පැය 03 යි

---

01. ''ලෝකයේ පෙරදිගින් බිහිවූ එස්. ආර්. රංගනාදන් සහ අපරදිගින් බිහිවූ මෙල්විල් ඩිවි ජගත් පුස්තකාලයාධිපතිත්වයේ වර්ධනය උදෙසා කර ඇති දායකත්වය අති විශිෂ්ටය.'' ජගත් පුස්තකාලයාධිපතිත්වයේ පියා යන විරුදාවලිය ලැබීමට මෙම දෙදෙනාගෙන් සුදුසු වන්නේ කවරෙක්දැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

02. ජාතික පුස්තකාල වර්ග පිළිබඳ විමසීමක් කර ඉන් එක් වර්ගයක් පිළිබඳ නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

03. පුස්තකාල සහයෝගිතාවය ලොවට අත්‍යවශ්‍යව ඇත්තේ තොරතුරු විප්ලවය (Information Explosion) නිසාය. සාකච්ඡා කරන්න.

04. ලිඛිත එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් තුළින් පුස්තකාලයකට ලැබිය හැකි වාසි පිළිබඳ විමසීමක් කරන්න.

05. ''සෑම වර්ගයක පුස්තකාල ගොඩනැගිල්ලක්ම විධිමත් ප්‍රමිතීන්ට අනුකූලව ඉදිවිය යුතු වුවද ශ්‍රී ලංකාවේ පුස්තකාල සන්දර්භයෙන් මෙම මූලධර්මය ගිලිහී ඇත.'' සාකච්ඡා කරන්න.

06. පුස්තකාල ව්‍යසන සැලැස්මක් (Disaster plan) යනු කුමක්දැයි හඳුන්වා එවන් සැලැස්මක් සකස් කිරීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු පිළිබඳ විමසීමක් කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතර වෙනස පහදන්න.

I. ප්‍රතිග්‍රහණය සහ පරිග්‍රහණය (Acquision and Accession)

II. අවශ්‍යතා ගොනුව සහ ලැබුණු ඇණවුම් ගොනුව
(Wants File and Order received File)

III. සාමූහික ප්‍රතිග්‍රහණය සහ මධ්‍යගත ප්‍රතිග්‍රහණය
(Cooperative Acquision and Centralized Acquision)

IV. විෂය ග්‍රන්ථ නාමාවලී සහ වෙළඳ ග්‍රන්ථ නාමාවලී
Subject bibliographies and Trade bibliographies)